www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 1968: ප්‍රන්ස මහා වැඩ වර්ජනය සහ ශිෂ්‍ය කැරැල්ල

# දෙවන කොටස - ප්‍රන්ස කොමියුනිස්ට් පක්ෂයේ සහ සීජීටීයේ පාවාදීම

**1968: The general strike and student revolt in France**
**Part 2—The betrayal of the PCF and CGT**

**පීටර් ෂ්වාට්ස් විසිනි**
**2008 මැයි 29**

*මෙහි පලවන්නේ ප්‍රන්සයේ 1968 මැයි/ජුනි සිද්ධීන් පිලිබඳව විමසා බැලෙන ලිපි මාලාවක දෙවැන්න යි. මැයි 28 දා පලකල පලමු කොටස මැයි මස අගභාගය වනවිට කූටයට ලඟාවූ ශිෂ්‍ය කැරැල්ලේ සහ මහා වැඩවර්ජනයේ වර්ධනය විමසා බලයි. මෙම දෙවන කොටස ප්‍රන්ස කොමියුනිස්ට් පක්ෂය පීසීඑෆ් සහ එමගින් පාලිත වෘත්තීය සමිතිය වන සීජීටීය ජනාධිපති චාල්ස් ඩි ගෝල්ට පාලනය යලි ලබාගැනීමට උපකාරීවූ ආකාරය විභාග කරයි. තුන්වන සහ හතරවන කොටස් පැබ්ලෝවාදීන්ගේ ක්‍රියා කලාපය විභාග කරන අතර අවසන් කොටස් පියරේ ලොම්බෙයාගේ ජාත්‍යන්තර කොමියුනිස්ට් සංවිධානය (ඕසීඅයි) පිලිබඳව විමසා බලයි.*

මැයි 20 දා සිට ප්‍රන්සය ඇනහිට තිබුනි. සියලු වැටුප් උපයන්නන්ගෙන් තුනෙන් දෙකක් දෙනා මහා වැඩ වර්ජනයට සහභාගි වූ අතර ශිෂ්‍යයෝ විශ්ව විද්‍යාල වාඩි ලා ගත්හ. මේ මොහොතේ ඩි ගෝල්ගේ සහ ඔහුගේ ආන්ඩුවේ ඉරනම රැඳී තිබුනේ ප්‍රන්ස කොමියුනිස්ට් පක්ෂය (පීසීඑෆ්) සහ එමගින් පාලිත සීජීටී (මහා කම්කරු සම්මේලය) වෘත්තීය සමිතිය අතයි. ජනාධිපති චාල්ස් ඩි ගෝල්ගේ කල් පැවැත්ම සහතික කොට පස්වන සමූහාන්ඩුව ආරක්ෂා කොට දුන්නෝ ඔවුහු ය. 1968 වන විටත් සාමාජිකයින් 350,000 ගනනක් සහිත සැලකිය යුතු දේශපාලන බලයක් වූ ප්‍රන්ස කොමියුනිස්ට් පක්ෂය 1967 මැතිවරනයේ දී සියයට 22.5ක ඡන්ද ප්‍රතිශතයක් ලබාගෙන තිබුනි. සීජීටීයේ සාමාජිකත්වය 1948 දී මිලියන 4ක්ව තිබී මේ වනවිට මිලියන 2.3 දක්වා ඇදවැටී තිබුන ද ආර්ථිකයේ මූලික අංශවල ආධිපත්‍යය සහිත වෘත්තීය සමිතිය වූයේ එය යි. එහි ලේකම් වූ ජෝර්ජස් සේගයි ප්‍රන්ස කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලන මන්ඩල සභිකයෙක් විය.

දැනට මත් අප දැක ඇති පරිදි ප්‍රන්ස කොමියුනිස්ට් පක්ෂය සහ සීජීටීය ශිෂ්‍ය විරෝධතාවන්ට ප්‍රතිචාර දැක්වූයේ නො සැඟවූ සතුරු භාවයකිනි. ශිෂ්‍යයන්ව කලහකාරීන් සහ ගෝල්වාදී ඒජන්තයින් ලෙස හෙලාදකිමින් ජෝර්ජස් මකායිස් මැයි 3 දා නිකුත් කල කුප්‍රකට ලිපිය ව්‍යතිරේකයක් නොව සැබෑ තත්වය විය. ප්‍රන්ස කොමියුනිස්ට් පක්ෂයේ දෛනික පුවත්පත වන ලහියුමනිතේ "වාම රැඩිකලුන්ට" බැන වැදීමෙන් වෙහෙසට පත් නො වූයේ පක්ෂයේ දක්ෂිනාංශික පිලිවෙතට එරෙහි වූ සියල්ලන් එයට ඇතුලත් කරමිනි. කම්කරුවන් සහ ශිෂ්‍යයන්ගේ ඒකාබද්ධ විරෝධතා පැවැත්වීම ප්‍රතික්ෂේප කල සීජීටීය කම්කරුවන් සමග සබඳතා ගොඩනගා ගැනීමට උත්සාහ කරමින් සිටි සිසුන් කම්හල්වලට ප්‍රවිෂ්ටවීමට ඉඩ නොදෙන ලෙස සිය සාමාජිකත්වයට උපදෙස් දුන්නේ ය.

කම්හල් අල්ලාගැනීම් සහ මහා වැඩවර්ජනය සීජීටීයේ කැමැත්තට එරෙහිව වර්ධනය වූයේ එහි පාලනයෙන් එපිට ගියේ ය. අනෙකුත් අල්ලාගැනීම් සියල්ලට ආදර්ශයක් බවට පත්වූ සඩ් ඒවියේෂන් අල්ලාගැනීම වැටුප් උපයන්නන්ගේ පහල ම කන්ඩායම් මත බලපෑම දැරූ සහ නාන්තේ ප්‍රදේශයේ දී ඕසීඅයි සාමාජික ට්‍රොට්ස්කිවාදී ඊවුස් රොක්ටන් විසින් නායකත්වය දෙන ලද ෆෝස් ඕරියරේ වෘත්තීය සමිතියේ ආරම්භකත්වය යටතේ සිදු විය. සීජීටීය අල්ලාගැනීම් නො වැලැක්වුව ද එය ඒවා තම පාලනය යටතේ තබාගැනීමටත් ඒවා හුදු කාර්මික ඉල්ලීම්වලට සීමා කිරීමටත් උත්සාහ දැරී ය. මධ්‍යම වැඩවර්ජන කමිටුවක් ස්ථාපනය කිරීමට විරුද්ධ වූ එය කර්මාන්තශාලාවලට පිටස්තර බලයන් සමග කිසිදු සහයෝගීත්වයක් ප්‍රතික්ෂේප කලේ ය. එය නායක කලමනාකාරීන් අඩස්සියට ගැනීම බලාත්මක කිරීම ද ප්‍රතික්ෂේප කලේ ය.

සීජීටීය සමග තරඟකාරී වෘත්තීය සමිතිය වූ සීඑෆ්ඩීටී (ප්‍රන්ස ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු සම්මේලනය) අල්ලාගැනීම් ධාරාව මත සිය බලපෑම යෙදීමට උත්සාහ දරන ප්‍රකාශයක් මැයි 16 දා නිකුත් කලේ ය. සීජීටීයට විලක්ෂනාත්මකව ශිෂ්‍ය කැරැල්ල කෙරෙහි ධනාත්මක වූ එය එම කැරැල්ල හැඳින්වූයේ "ඔවුන්ට (ශිෂ්‍යයන්ට) තම වගකීම් අභිභවනය කල නො හැකි සමාජයක තට්ටු ගැසී හිරවුනු පන්ති ව්‍යුහයකට" එරෙහිව

යොමුවන බවයි. සීඑෆ්ඩීටීය කර්මාන්තශාලාවලට " ස්වයං-කලමනාකරනය" (ඔටෝගෙෂන්) ගැන මග පෙන්වී ය. "කාර්මික සහ පරිපාලන රාජාන්ඩුව ස්වයං-කලමනාකරනය මත පදනම් වූ පරිපාලන ව්‍යුහයන් මගින් විස්ථාපනය කරනු ලැබිය යුතු ය." මෙයට කෝපයෙන් මූර්ජා වී ප්‍රතිචාර දැක්වූ සීජීටී නායක සේගයි ප්‍රසිද්ධියේ සීඑෆ්ඩීටීයට ප්‍රහාර එල්ල කලේ ය. කොතරම් සීමාසහිත වූයේ වුව වර්ධනය වන ව්‍යාපාරයට පොදු දිශානතියක් ලබාදීමේ ඕනෑම උත්සාහයක් ඔහු ප්‍රතික්ෂේප කලේ ය.

මේ වනවිට මිචෙල් රොකාඩ්ගේ වාම ප්‍රතිසංස්කරනවාදී පීඑස්යූවේ (එක්සත් සමාජවාදී පක්ෂය) අනුහස යටතේ සිටි සීඑෆ්ඩීටීයේ ඉල්ලීම ද ධාවනය කරනු ඇත්තේ ආවෘත අන්තරයකට ය. එය ධනේශ්වර පාලනය හෝ ධනේශ්වර වෙලඳපොලේ ආධිපත්‍යය යන එකක්වත් ප්‍රශ්නයට භාජනය කලේ නැත.

අවසානයේ මැයි 25 දා වැටලීමට ලක්ව තිබුනු ආන්ඩුවේ උපකාරයට සීජීටීය ලහිලහියේ ඉදිරිපත් විය. පස්වරු 3ට පමන වෘත්තීය සමිති, හාම්පුතුන්ගේ සංගම් සහ ආන්ඩුවේ නියෝජිතයෝ රුවේ ඩි ග්‍රෙනල්හි කම්කරු අමාත්‍යාංශයේ දී මුනගැසුනාහ. ඔවුන්ගේ ඉලක්කය වූයේ හැකි ඉක්මනින් කම්හල් තුල තත්වය යලි සහතික කිරීම ය. සියලු වෘත්තීය සමිතිවල නියෝජිතයින් සහභාගි වුව ද සාකච්ඡා මුලුමනින් ම පාහේ මෙහෙයවන ලද්දේ අගමැති ජෝර්ජස් පොම්පිඩෝ සහ සීජීටී නායක ජෝර්ජස් සේගයි විසිනි.

සේගයිට අවශ්‍ය වූයේ බොහෝ කම්හල්වල කම්කරුවන් ඉල්ලා සිටි පරිදි විවිධ වැටුප් වර්ග අතර පරතරය අඩුකිරීම නොව රේඛීය වැටුප් වැඩි වීමකි. ඊට අමතරව වෘත්තීය සමිතිවල තත්වය ශක්තිමත් කිරීම කල යුතු විය. මෙම කරුනේ දී ඔහුට හාම්පුතුන්ගේ සංගම්වලට එරෙහිව පොම්පිඩෝගේ සහයෝගය ලැබිනි. රැස්වීමේ වාර්තාවල එන සූත්‍රගත කිරීම වන්නේ "අවශ්‍ය පුහුනුව සහ සුදුසු බලපෑම ඇත්තා වූ ද කම්හල් මෘදු ලෙස පාලනය කිරීමට උපකාරී වන්නා වූ ද වෘත්තීය සමති හරහා කම්කරු පන්තිය ඒකාග්‍ර වීමේ අවශ්‍යතාවය ගැන ආන්ඩුව ඒත්තු ගෙන ඇත" යනුවෙනි.

ජෝර්ජස් පොම්පිඩෝට අමතරව සාකච්ඡා මේසයේ ආන්ඩුව පැත්තේ අනාගත ජනාධිපතිවරයෙකු වන ජැක් චිරැක් මෙන් ම අනාගත අගමැතිවරයෙකු වන එඩුවාඩ් බලදූර් ද වාඩි වී සිටිය හ. වර්තමාන ජනාධිපති නිකලස් සාකෝසි මෙන් ඔවුහු ද එකල එකඟතාවට ආසක්තව කම්කරු පන්තිය "ඒකාග්‍ර" කරගැනීම සඳහා වෘත්තීය සමිති උපයෝගී කරගැනීමට කැමැත්තෙන් පසු වූහ. එතැන් පටන් "ග්‍රෙනල්" යන වචනය ආන්ඩුව, වෘත්තීය සමිති හා හාම්පුතුන් ඒ වර්ගයේ ඉහල මට්ටමේ හමුවීම් සඳහා සමානාර්ථ පදයක් බවට පත්විය.

යාන්තම් දින දෙකක් ඇතුලත සාකච්ඡා සහභාගිකරුවෝ එකඟතාවට පැමිනිය හ. මැයි 27 වන සඳුදා පූර්වභාගයේ ඔවුහු ග්‍රෙනල් ගිවිසුමට අත්සන් තැබූහ. සියයට 7ක වැටුප් වැඩිවීමක්, අවම වැටුප පැයට ෆ්‍රෑන්ක් 2.22 සිට 3 දක්වා නැගීමක් සහ වෘත්තීය කම්හල් තුල නීතියට අනුගත වීමක් එයට අන්තර්ගත විය. සීජීටීය තම මූලික ඉල්ලීම් වන රේඛීය වැටුප් පරිමානයක්, වර්ජිත දින සඳහා පූර්න වැටුප් ගෙවීම සහ සමාජ ආරක්ෂාව සම්බන්ධ ආන්ඩුවේ රෙගුලාසි හකුලාගැනීම ආදිය ඉවත දැම්මේ ය. රොකාඩ්ගේ පීඑස්යූව, සීඑෆ්ඩීටීය සහ යූඑන්ඊඑෆ් (ප්‍රන්ස ජාතික ශිෂ්‍ය සංගමය) සමිතිය විරෝධතාවක් සැලසුම් කරන බව දැනගැනීමෙන් පසු ප්‍රන්ස කොමියුනිස්ට් පක්ෂය සහ සීජීටීය සමග කිසිදු පූර්ව එකඟත්වයකින් තොරව උදෑසන ජැක් චිරැක් සමග කල පුද්ගලික සාකච්ඡාවකින් පසු ක්ෂනික ගනුදෙනුවකට සේගයි පැනගති.

උදෑසන 7.30ට මාධ්‍ය හමුවේ පෙනීසිටි සේගයි සහ පොම්පිඩෝ ග්‍රෙනල් ගිවිසුම නිවේදනය කල හ. "ප්‍රමාදයකින් තොරව යලි වැඩ පටන් ගත හැකි ය" යි සේගයි විස්තර කලේ ය. රෙනෝල්ට් කර්මාන්තශාලාවේ කම්කරුවන්ට ගිවිසුම විකිනීම සඳහා ඔහු පුද්ගලිකව බිලැන්කෝට් බලා ගියේ ය. එහෙත් කම්කරුවෝ ගිවිසුම ප්‍රකෝපකරනයක් ලෙස සැලකුවේ ෆ්‍රෑන්ක් කිහිපයකට විකිනෙනු ලැබීමට සූදානම් නො වූහ. සේගයිට පිට පිට හූ තබනු ලැබුවේ ය. ගිවිසුම පිලිබඳ ආරංචිය ලැව් ගින්නක් මෙන් රටපුරා පැතිර ගිය අතර කිසිවෙක් වර්ජනයෙන් බිඳීමට කැමති නො වූහ. පසු දින ල මොන්ඩේ පුවත්පතේ සිරස්තලය වූයේ "වර්ජකයන් නැවත වැඩට පොලඹවා ගැනීමට සීජීටීය අසමත් වේ" යන්නයි.

## බලය පිලිබඳ ප්‍රශ්නය ඉස්මතු වේ

මේ වනවිට දේශපාලන අර්බුදය එහි උච්චස්ථානයට ලඟා වී තිබුනි. සමස්ත රට ම උද්ඝෝෂනවලින් පිරී පැවතුනි. ආන්ඩුවට තම අධිකාරය අහිමිව තිබූ අතර සීජීටීය අතින් කම්කරුවන් පාලනය ගිලිහී තිබුනි. දැන් විවෘතව ඉස්මත්තට පැමින තිබුනේ රටේ පාලනය අභිභවනය කරන්නේ කවුරුන් ද යන ගැටලුව ය යන්න ගැන කිසිවෙකුට සැකයක් නො වීය.

මෙතෙක් වේලා ප්‍රවේසමෙන් පසුපසට වී සිටි සමාජ ප්‍රජාතන්ත්‍රවාදියෝ දැන් තම හඬ අවදි කල හ. ඩි ගෝල්ට බලයේ එල්ලී සිටිය හැකි ද යන්න ප්‍රශ්නාර්ථයක් වූ නිසා විකල්ප ධනපති ආන්ඩුවක් සඳහා සූදානම් සකසනු ලැබිනි. ෆ්‍රංශුවා මිතරොං රූපවාහිනියෙන් සවිස්තරව වාර්තා කරන ලද පුවත්පත් සාකච්ඡාවක් සංවිධානය කලේ ය. අන්තර්වාර ආන්ඩුවක් සහ තමන් ද අපේක්ෂකයෙක් වන නව ජනාධිපතිවරනයක් සඳහා ඔහු තම සහයෝගය ප්‍රකාශ කලේ ය.

මිතරොං, හතරවන සමූහාන්ඩුව සමයේ තමන්ව ම අපකීර්තියට පත් කර ගෙන කිසිදු මහජන පදනමක් රහිතව සිටි ලිබරල් සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවල සංධානයක් වූ ප්‍රජාතන්ත්‍රවාදී සහ සමාජවාදී වාමාංශික සම්මේලනයේ (එෆ්ජීඩීඑස්) නායකත්වය දැරී ය. 1965 ජනාධිපතිවරනයේ දී ඩි ගෝල්ට අභියෝග කර තිබුනු ඔහුට ප්‍රන්ස කොමියුනිස්ට් පක්ෂයේ සහයෝගය ද ලැබී තිබුනි.

පීඑස්යූව, සීඑෆ්ඩීටීය සහ යූඑන්එෆ්එෆ් සමිතිය තම බලාපොරොත්තු රැඳවූයේ පියරේ මෙන්ඩේ-ෆ්‍රාන්ස් මත ය. 1936 දී මෙන්ඩේ-ෆ්‍රාන්ස් මුලුමනින් ම ධනේශ්වර පක්ෂයක් වූ රැඩිකල් සමාජවාදීන්හි සාමාජිකයෙක් වූ ලියොන් බ්ලම්ගේ මහජන පෙරමුනු ආන්ඩුවට සම්බන්ධ වී තිබුනි. යුද්ධයේ දී ඔහු ජෙනරල් ඩි ගෝල්ට සහාය දැක්වී ය. හතරවන සමූහාන්ඩුව සමයේ 1954 දී ආන්ඩුවේ නායකයා ලෙස ඔහු වියට්නාමයෙන් ප්‍රන්ස හමුදා ආපසු කැඳවීම සංවිධානය කලේ දක්ෂිනාංශයේ වෛරයට ලක්වෙමිනි. 1968 වනවිට ඔහු පීඑස්යූවට සමීපව සිටියේ ය.

මෙන්ඩේ-ෆ්‍රාන්ස්ගේ ප්‍රකාශිත බටහිර දිශානතියේ අර්ථය වූයේ ඔහු ප්‍රන්ස කොපය ඔහුට පරම සතුරෙකු ලෙස සලකන බවයි. පැරිසියේ චාලෙට් ක්‍රීඩාංගනයේ මැයි 27 දා පීඑස්යූ, සීඑෆ්ඩීටී සහ යූඑන්එෆ්එෆ් සංවිධානවල මහා රැලියක ඔහුව දැකගැනීමට ලැබුනුවිට ප්‍රන්ස කොප මූලස්ථානයේ අනතුරු නලා හැඬවුනි. මිතරොං සහ මෙන්ඩේ-ෆ්‍රාන්ස් තමන්ට කිසිදු බලපෑමක් කල නො හැකි නව ආන්ඩුවක් බිහි කිරීමේ හැකියාව පිලිබඳව ප්‍රන්ස කොපය බිය විය.

මැයි 29 දා ප්‍රන්ස කොපය සහ සීජීටීය තමන්ගේ ම විරෝධතාවක් පැරිසියේ පැවැත්වූ හ. "ජනතා ආන්ඩුවක් සඳහා" යන සටන් පාඨය රැගෙන සියදහස් කිහිපයක් අගනුවර පෙලපාලි ගිය හ. ප්‍රන්ස කොපය විප්ලවවාදී ලෙස බලය අල්ලාගැනීම ගැන සිහිනෙන්වත් දුටුවේ නැත. "ජනතා ආන්ඩුවක්" සඳහා එහි ඉල්ලීම වනාහි පස්වන සමූහාන්ඩුවේ ආයතනවලට අභියෝග නො කොට කම්හල්වල විප්ලවවාදී මනෝගතීන් අස්වැසීමට ගත් උත්සාහයකි. "ප්‍රජාතාන්ත්‍රික වෙනසක" අවශ්‍යතාව අවධාරනය කරමින් සීජීටීය විප්ලවීය ක්‍රියාකාරීත්වය ප්‍රතික්ෂේප කලේ ය.

පැරිස් පොලිස් ප්‍රධානියා පසුව වාර්තා කලේ සීජීටී-ප්‍රන්ස කොප විරෝධතාව ගැන තමන්ට එතරම් තැකීමක් නො තිබුනු බව යිඃ ඔහු බලාපොරොත්තු වූයේ සිදු වූ පරිදි ම සම්භාව්‍ය විනයගත වෘත්තීය සමිති විරෝධතාවකි. එහෙත් සංවිධායකයන්ට තත්වය පාලනය කර ගතහැකි ද යන්න පිලිබඳව ආන්ඩුවට සැක සංකා තිබුනි. හමුදා අතිරේක භට කන්ඩායම් සීරුවෙන් තබන ලද අතර පූර්ව ආරක්ෂක ක්‍රියාවක් ලෙස යුද ටැංකි පැරිස් තදාසන්න ප්‍රදේශවල ස්ථානගත කරනු ලැබී ය.

තත්වය පිලිබඳව සාකච්ඡා කිරීම සඳහා ප්‍රන්ස කොමියුනිස්ට් පක්ෂ මධ්‍යම කාරක සභාව මැයි 30 දා රැස්විය. එම රැස්වීමේ පරිගත කරන ලද වාර්තාවක් තහවුරු කරන්නේ එම පක්ෂය තමන් අතට බලය ගැනීමේ කිසිදු අයුරකින් අදහස් නො කල බව හා පවත්නා පර්යාය රැකීමට මුලුමනින් පේ වුනු බව ය. මාස හයකට පසුව මධ්‍යම කාරක සභා ප්‍රකාශයක් එම ආකල්පය තහවුරු කරයිඃ "බල තුලනය පසුගිය මැයි මාසයේ කම්කරු පන්තියට සහ එහි ආධාරකරුවන්ට බලය ගැනීමට ඉඩ දුන්නේ නැත."

මැයි 30 දා රැස්වීමේ දී ලේකම් ජනරාල් එමිල් වොල්ඩෙක්-රොචේ ෆ්‍රංශුවා ප්‍රන්ස කොමියුනිස්ට් පක්ෂයට ප්‍රමානවත් බලතල දෙන්නේ නම් ඔහුගේ නායකත්වය යටතේ අන්තර්වාර ආන්ඩුවකට සම්බන්ධ වීමට ඇති සූදානම ප්‍රකාශ කලේ ය. එවැනි ආන්ඩුවක් කර්තව්‍යයන් තුනක් සම්පූර්න කල යුතු බව ඔහු කීවේ ය. එනම් නැවත රාජ්‍යය ක්‍රියාත්මක කිරීම, වර්ජකයන්ගේ සාධාරන ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම සහ ජනාධිපතිවරනය පැවැත්වීම ය.

එහෙත් ප්‍රන්ස කොපය වඩා කැමති විකල්පය වූයේ පාර්ලිමේන්තු මැතිවරන ක්ෂනිකව පැවැත්වීම යි. පොදු ආකල්පය කැටිකොට දක්වමින් පක්ෂ කථිකයකු කියා සිටියේ "අපට වාසි ගත හැක්කේ පාර්ලිමේන්තු මැතිවරනයකින් පමනකි" යනුවෙනි. මෙදින තත්වය පැවතියේ පිහිතුඩක් මත ය. කලින් දින සන්ධ්‍යාවේ ජනරාල් ඩි ගෝල් අතුරුදහන්ව ගියේ ජර්මනියේ සිටි ප්‍රන්ස හමුදා නායක ජනරාල් මාසු සමග බේඩින්-බේඩින් හි දී සාකච්ඡා පැවැත්වී ය. ඇල්ජීරියානු යුද්ධයේ දී දැක්වූ භූමිකාව නිසා මාසු කුප්‍රකටව සිටියේ ය. ඩි ගෝල් පලායාමට සූදානම් වන්නේ ද නැතහොත් තවමත් සහයෝගය සොයමින් සියියේ ද යන්න මෙ දින දක්වා ම ගැටලුවක්ව පැවතුනි. තම මතක සටහන්වල මාසු පසුව ප්‍රකාශ කලේ තමන් ඩි ගෝල්ට ආපසු පැරිසියට ගොස් ප්‍රන්ස ජනයා අමතන ලෙස උපදෙස් දුන් බව යි.

මැයි 30 දා අපරභාගයේ ඩි ගෝල් රේඩියෝවෙන් කතාවක් කලේ ය. ඔහු ප්‍රකාශ කලේ සමූහාන්ඩුව අනතුරේ වැටී ඇති බව සහ එය රැකගනු ලැබිය යුතු බව යි. පාර්ලිමේන්තුව විසුරුවා හල බව නිවේදනය කල ඔහු ජුනි 23 සහ 30 දිනවලට නව මැතිවරන නියම කලේ ය. ඒ අතර ම ජනරාල් වරයාගේ සහායකයින් සිය දහස් කිහිපයක් ප්‍රන්ස ජාතික වර්නවලින් සැරසී චැම්ප්ස් එලිසී හි උද්ඝෝෂනයේ යෙදුන හ.

ඩි ගෝල්ගේ තීරනයට එදින සන්ධ්‍යාවේ ම සහාය පලකල ප්‍රන්ස කොපය තම පිලිවෙත් ම සාර්ථක ප්‍රතිඵලයක් ලෙස එය හුවා දැක්වූවේ ය. පස්වන සමූහාන්ඩුවේ නෛතික රාමුවට සහාය දක්වන බව

සපථ කල ප්‍රන්ස කොපය "රතු ධජයේ සහ ජාතියේ ත්‍රෛවර්න ධජයේ" එකමුතු බව ප්‍රකාශ කරමින් ගෝල්වාදීන් සමග ගාල්වීමේ මං සෙවී ය. මැයි 31 දා සීජීටී නායක ජෝර්ජස් සේගයි මැතිවරන සමග තමන්ගේ එකඟත්වය නිවේදනය කලේ ය. "මැතිවරන පැවැත්වීමට සීජීටීය බාධා කරන්නේ නැත" යනුවෙන් ඔහු කල ප්‍රකාශය රට අලලාගෙන තිබුනු පක්ෂඝාත තත්වය යටතේ අර්ථවත් කලේ මහා වැඩ වර්ජනය අත්හරින බව යිඃ "එය කම්කරුවන්ට වෙනසක් සඳහා තම අභිලාෂය ප්‍රකාශ කිරීමට අවස්ථාවකි."

දැන් වර්ජන සහ වාඩි ලා ගැනීම් මැතිවරනයට පෙර අවසන් කිරීමට සීජීටීය තම මුලු ශක්තිය යෙදූ අතර එසේ කිරීමට එය සමත් වූවේ අසීරුතාවන් මධ්‍යයේ ය. එහෙත් ක්‍රමයෙන් වර්ජන පෙරමුන විසිරී ගියේ ය. කර්මාන්තශාලා ගිවිසුම් ඇතිකර ගැනීම් අවසන් වීමෙන් පසුව කම්කරුවෝ නැවත වැඩට පැමිනි අතර වඩා සටන්කාමී කොටස් හුදකලා වී පොලිසිය විශ්ව විද්‍යාල මුදාගැනීම ඇරඹී ය. ජූනි 16 දා රෙනෝල්ට්-බිලන්කෝට් කම්කරුවෝ මැතිවරනයට සතියකට පෙර යලි වැඩ ඇරඹූ අතර එදින ම සෝබෝන් විශ්ව විද්‍යාලය මුදා ගැනුනි.

එහෙත් අවසන් වර්ජන සහ වාඩිලාගැනීම් අවසන් කරනු ලැබීමට පෙර තවත් සති කිහිපයක් ගත වූ අතර පසුව එලැඹුනු මාස සහ අවුරුදුවල රට ශාන්තභාවයට පෙරලා පැමිනියේ නැත. කෙසේ වෙතත් කම්කරු පන්තිය දේශපාලන බලය ලබාගැනීමේ අවස්ථාවක් අතපසු කරගෙන තිබුනි.

සීජීටීයේ ඉතිහාස රචක මිචෙල් ඩ්‍රෙෆුස් මහා වැඩ වර්ජනයේ උච්ඡාවස්ථාවේ වඩාත් බලගතු වෘත්තීය සමිතියේ ආකලපය පහත පරිදි කැටිකොට දක්වයිඃ " බලයන්ගේ තුලනය තමන්ට වාසි සහගතව තිබූ 1968 මැයි මාසයේ දී සීජීටීය හිතාමතා ම රාජ්‍යය සමග මුනගැටුමෙන් වැලකුනි."

## දක්ෂිනාංශික ප්‍රතිප්‍රහාරයක්

මැයි මාසයේ මුල් සතිවල දේශපාලනික දක්ෂිනාංශය සම්පූර්නයෙන් ම පක්ෂාඝාත වී හුදෙකලා විය. දැන් ප්‍රන්ස කොපයට සහ සීජීටීයට ස්තුති වන්නට එය ක්‍රමයෙන් ආරම්භය ලබාගෙන එහි ස්වයං-විශ්වාසය යලි ලබාගත්තේ ය. මැතිවරන උද්ඝෝෂනය ඇරඹීමත් සමග අරගලය වීදි සහ කර්මාන්තශාලාවල සිට ඡන්ද පෙට්ටිවලට මාරු වූයේ ඩි ගෝල්ට සහ ඔහුගේ සහචරයන්ට වාසි ගෙන දෙමිනි. දැන් ඔවුන් සිටියේ "නිශ්ශබ්ද බහුතරයේ" බියගුලු භාවයන්ට ආයාචනා කරමින් සමාජයේ වඩා අක්‍රිය සහ පසුගාමී කොටස් කරලියට ගෙන එන තත්වයක ය.

මැයි මාසය තුල ම මේ දිශානතියේ පලමු උත්සාහයන් දැක ගත හැකි විය. මේ කාලසීමාවේ පෞද්ගලික විකාශකයන් නොමැති තතු තුල ආන්ඩුව රාජ්‍යය මගින් පාලිත මාධ්‍ය මත දැඩි වාරනයක් පවත්වාගෙන ගියේ ය. ආන්ඩුව මැයි 19 දා විරුද්ධ පක්ෂයට වාසි විය හැකි තොරතුරු පතුරුවාලීම රූපවාහිනියට තහනම් කලේ ය. මැයි 23 දා එය ප්‍රන්සය තුල දී සවන් දිය හැකි සංඛ්‍යාතයන් භාවිතා කරනු ලබන සහ විරෝධතාවල සිට සජීවී වාර්තාකරනයේ යෙදෙන මාධ්‍යවේදීන් අයත් විදෙස් විකාශනයන් වසා දැමී ය.

මැයි 22 දා ආන්ඩුව ඩැනියෙල් කෝන්-බෙන්ඩිට්ගේ පුරවැසි බලපත්‍රය ආපසු ලබා ගත්තේ ය. ජර්මානු ගමන් බලපත්‍රයක් අතැතිව සිටි මෙම ශිෂ්‍ය නායකයා නාසීන්ගෙන් ගැලවීම සඳහා ප්‍රන්සයට පලා ආ පවුලකට අයත් වූවෙකි. නාසි තන්ත්‍රය අවසන් වී ගෙවී ගතව තිබුනේ යන්තම් අවුරුදු 23ක් වන තතු තුල මෙම ක්‍රියාවේ සංකේතනය සියල්ලන්ට දැක ගත හැකි විය. බලවත් කෝපයක් තිබුනු අතර ශිෂ්‍ය විරෝධතා වඩා රැඩිකල් ස්වභාවයක් අයත් කර ගත්තේ ය. ප්‍රචන්ඩ වීදි සටන් යලි ඇරඹුනි. සීජීටී ය දිගින් දිගට ම ශිෂ්‍යයන් හුදකලා කරමින් ඔවුන් සමග කිසිදු ඒකාබද්ධ ක්‍රියාමාර්ගයක් ප්‍රතික්ෂේප කල තතු තුල ශිෂ්‍යයන් නිරන්තරයෙන් කම්කරු ආරක්ෂාව රහිතව ක්‍රියා කල අතර එමගින් තත්වය වඩ වඩා පුපුරන සුලු අඩියකට පත් කලේ ය.

මැයි 24 දා ප්‍රචන්ඩ කැරලි දෙදෙනෙක් බිලි ගත්හ. ලියොන් හි පොලිස් භටයෙක් මිය ගිය අතර පැරිසියේ දී තරුන විරෝධතා කරුවෙක්ව ඝාතනය කරනු ලැබිනි. තිගැස්ම විශාල වූයේ මාධ්‍ය "ශිෂ්‍ය ප්‍රචන්ඩතා අවුලුවන්නන්ට" එරෙහිව කන් බිහිරි කරන උද්ඝෝෂනයක් ඇරඹී ය. සමහර ගෝල්වාදියෝ ඇල්ජීරියානු ප්‍රන්ස ජාතිකයන් අතරින් ඇදගත් අන්ත දක්ෂිනාංශක කන්ඩායම් සමග සහයෝගී සමූහාන්ඩුවේ ආරක්ෂාව සඳහා වූ කමිටුවක් (සීඩීආර්) නිර්මානය කලහ. ඩි ගෝල් ඇල්ජීරියාවට නිදහස ප්‍රදානය කල නිසා ඇල්ජීරියානු ප්‍රන්ස ජාතිකයෝ ඔහු ද්‍රෝහියෙකු ලෙස සැලකුවත් විප්ලවය පිලිබඳ භීතිය වෙනස් වර්ගවල දක්ෂිනාංශික කොටස් එකමුතු කලේ ය. මැයි 30 දා "ඇල්ජීරියාව ප්‍රන්ස ජාතිකයි" යන ඝෝෂා එලිසි මාලිගයේ ගෝල්වාදී සංකේත සමග එකතු විය. ඩි ගෝල්ට සහය පලකරන ප්‍රථම විශාල පෙලපාලිය ඒකාබද්ධව සූදානම් කරනු ලැබ තිබිනි. ජූනි 17 දා ඩි ගෝල් එයට ප්‍රති උපකාර දැක්වූයේ 1961 ඇල්ජීරියාවේ දී ඔහුට එරෙහිව ප්‍රචන්ඩ කැරැල්ලක් සංවිධානය කොට තිබුනු ජෙනරාල් රාහුල් සලන් සහ ඕඒඑස් ත්‍රස්තවාදී සංවිධානයේ තවත් සාමාජිකයන් 10 දෙනෙකුට සමාව ප්‍රදානය කරමිනි.

මැතිවරන උද්ඝෝෂනය ඇරඹීමත් සමග රාජ්‍යයේ පීඩක මෙවලම් වඩා වැඩි ස්වයං-විශ්වාසයකින් කටයුතු ඇරඹූහ. මැයි 31 දා ක්‍රිස්ටියන් ෆවුෂේව අභ්‍යන්තර

කටයුතු අමාත්‍ය ධුරයෙන් ඉවත් කොට එම ධුරයට රේමන්ඩ් මාසෙලින්ව පත් කරනු ලැබී ය. ඩි ගෝල් මාසෙලින්ව සාදරයෙන් පිලිගත්තේ, 1789 ප්‍රන්ස විප්ලවයේ පරිහානි කාල පරිච්ඡේදයේ පාලක සභාව සහ නැපෝලියන් යටතේ පොලිස් ඇමති ලෙස පත්ව පුලුල් පීඩක යන්ත්‍රනයක් නිර්මානය කල ජෝසෆ් ෆවුෂේව සිහිපත් කරවමින් "අවසානයේ දී සැබෑ ෆවුෂේ කෙනෙක්" යයි කියමිනි.

මාසෙලින් ක්‍රියා කලේ අන්ත කුරිරු භාවයකිනි. ඔහු පත්කල දින ඉන්ධන සැපයුම් සුරක්ෂිත කිරීමට හා රථවාහන ගමනාගමනය යලි ඇරඹීම සඳහා ඉන්ධන ඩිපෝවලට පිටතින් තිබුනු පිකට් සුද්ධ කරනු ලැබිනි. ජුනි 12 දා ඔහු මැතිවරන උද්ඝෝෂන කාලසීමාව තුල වීදි විරෝධතා තහනම් කලේ ය. එදින ම සියලු විප්ලවවාදී සංවිධාන විසුරුවා හැරීමේ ආඥාවක් නිකුත් කරන ලද්දේ "සැක කටයුතු විදේශිකයින්" 200ක් රටින් පිටුවහල් කරමිනි. තහනම ට්‍රොට්ස්කිවාදී ඕසීඅයි සංවිධානය, එහි තරුන සහ ශිෂ්‍ය සංවිධාන, ඇලේන් ක්‍රිවින්ගේ විප්ලවවාදී කොමියුනිස්ට් තරුනයෝ සහ ඩැනියෙල් කෝන්-බෙන්ඩිට්ගේ අරාජකවාදී "මාර්තු 22 ව්‍යාපාරය" ට මෙන් ම මාඕවාදී සංවිධානවලට ද බල පැවැත්වී ය.

ඒවායේ සෑම සාමාජිකයෙකු ම අධීක්ෂනය කිරීමට සහ ඔවුන්ගේ තොරතුරු රැස්කිරීමට අභ්‍යන්තර රහස් සේවයට නියෝග කරනු ලැබිනි.

වසර හයක් තනතුරේ සිටි මාසෙලින් එම කාලය තුල පොලීසිය, රහස් සේවය සහ විශේෂ කැරලි පොලීසිය ඉහලින් ම සූදානම් සිවිල් යුද උපකරනයක් වර්ධනය කිරීමට සමත් විය. ඔහු පොලිස් හමුදාව මත වියදම දෙගුන කර එය නවීන තාක්ෂනය සහ ආයුධවලින් සන්නද්ධ කලේ නව පොලිස් නිලධාරීන් 20,000 ක් බඳවා ගනිමිනි.

ගෝල්වාදියෝ මැතිවරන උද්ඝෝෂනය මෙහෙයැවූයේ භීතිය මත පදනම් වෙමිනි. සිවිල් යුද්ධයේ තර්ජනය ඉස්මතු කොට දක්වමින් කොමියුනිස්ට්වාදී ආඥාදායක තන්ත්‍රයක් පිලිබඳව අනතුරු ඇඟවූ ඔවුහු සමූහාන්ඩුව හා ජාතිය අතර එක්සත් භාවය ගැන දේශනා කලහ. විරුද්ධ පක්ෂ සහ වෘත්තීය සමිති මෙයට අත්වැල් ගායනා කලහ. "වාම රැඩිකලුන්ට" එරෙහි ප්‍රන්ස කොපයේ අනවරත උද්ඝෝෂනය දක්ෂිනාංශික ප්‍රචාරක ඇඹරුම් යන්ත්‍ර සඳහා අඹරන ද්‍රව්‍ය බවට පත් විය. මැතිවරනයේ මුවවිට රූපවාහිනියේ පෙනී සිටි ප්‍රන්සුවා මිතරොං මෙසේ විරෝධය දැක්වී යෑ "කොතරම් අපට ප්‍රහාර එල්ල වුව ද ප්‍රථම දිනයේ පටන් අප සිතා බලා ඇත්තේ පීතෘභූමියේ එක්සත් භාවය සාමය ආරක්ෂා කිරීම වෙනුවෙන් පමනි."

මැතිවරනය නිල වාමාංශයට ඛේදවාචකයක් විය. ගෝල්වාදියෝ සහ ඔවුන්ගේ ආධාරකරුවෝ ඡන්දයෙන් සියයට 46ක් ලබා ගත්තේ ප්‍රන්ස කොපය ඊට පෙර වසරටත් අඩුවෙන් සියයට 20ක් පමනක් ලබා ගනිද්දී ය. වැඩි ම ඡන්ද ලබාගත් තැනැත්තා ජයගන්නා මැතිවරන ක්‍රමයේ අර්ථය වූයේ ආසන බෙදීමේ දී ප්‍රතිඵලය තව තවත් ව්‍යසනකාරී වීම ය. ආසනවලින් පහෙන් හතරක් ම ලැබගත්තේ දක්ෂිනාංශික ධනේශ්වර පක්ෂ ය. ඒ ගෝල්වාදීන්ට සියයට 59ක්, ලිබරලුන්ට සියයට 13 ක් සහ මධ්‍ය පක්ෂවලට සියයට 7ක් වසයෙනි. මිතරොංගේ ප්‍රජාතන්ත්‍රවාදී සහ සමාජවාදී සම්මේලනය (එෆ්ජීඩීඑස්) ආසනවලින් සියයට 12ක් ලබද්දී ප්‍රන්ස කොපයට ලැබුනේ සියයට 7ක් පමනි.

සියල්ලට ම ත් වඩා ග්‍රාමීය ගතානුගතික ප්‍රදේශ අතිමහත් බහුතරයක් දක්ෂිනාංශයට ඡන්දය දුන්නේ වඩා ක්‍රියාකාරී - උසස් පාඨශාලා සිසුන්, විශ්ව විද්‍යාල සිසුන්, තරුන කම්කරුවන් සහ සංක්‍රමනිකයන් - කොටස්වලින් බොහොමයක් ඡන්දය දීමට සුදුසුකම් නො ලබද්දී ය. ඡන්දය දීමට සුදුසු නිල වයස අවුරුදු 21ක් වූ අතර හදිසියේ කැඳවූ මැතිවරනයට පෙර මැතිවරන ලැයිස්තු යාවත්කාලීන කර නො තිබින.

විප්ලවවාදී අර්බුදය ඇරඹී මාස දෙකකට පසුව ධනේශ්වරය බලය මත තම ග්‍රහනය පුනස්ථාපනය කරගැනීමට සමත් විය. ඩි ගෝල්ව සාමකාමී ලෙස විස්ථාපනය කිරීමටත් මිතරොංගේ සමාජවාදී පක්ෂය හරහා එලඹෙන දශක ගනනාවක් පුරා තම පාලනය සහතික කරගැනීමටත් කම්කරු පන්තිය තම පාලනය යටතේ තබාගැනීමටත් නව දේශපාලනික යන්ත්‍රනයක් වර්ධනය කිරීමට එයට දැන් කල් ලැබුනි.

මේ සඳහා එය ආර්ථික මිලක් ගෙවිය යුතු විය. පොදු සම්මුතිය අවසානයේ බලාත්මක වූ අතර එලඹෙන වසරවල කම්කරු ජනතාව තම ජීවන කොන්දේසිවල පැහැදිලි වර්ධනයක් අත්දැක ගති. එහෙත් මෙම වර්ධනයන් වැඩිකල් නො පැවතුනු අතර මේ වනවිට ඒවායින් බොහොමයක් ආපසු උදුරාගෙන තිබේ.

***මතු සම්බන්ධයි***

© www.wsws.org